මුල් පිටපත/ අනු පිටපත

යොමු අංකය :-

**ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රය**

**දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

**<u>නීත්‍ය මගී ප්‍රවාහන අවසර පත්‍ර ලබා ගැනීම</u>**

**1. ටෙන්ඩර් ඉල්ලුම්කරු පිළිබඳ විස්තර**

I. සම්පූර්ණ නම :---------------------------------------------------------
II. ලිපිනය :---------------------------------------------------------
III. හැදුනුම්පත්‍ර අංකය :-----------------------
IV. දුරකථන අංකය :-----------------------
V. සමාගමක් හෝ වෙනත් ආයතනයක් නම් එහි නම :----------------------------------------
VI. ලියාපදිංචි අංකය :-------------------------

**2. දැනට අධිකාරියේ මගී ප්‍රවාහන බලපත්‍ර ලබාගෙන ඇතිනම් ඒ පිළිබඳ විස්තර**

| අනු අංකය | බස්රථ අංකය | බලපත්‍ර අංකය | මාර්ග අංකය | සේවය |
|---|---|---|---|---|
| | | | | |

**3. බස්රථය පිළිබඳ විස්තර**

I. බස්රථයක් තිබේ නම් එහි අංකය :---------------------- ආසන ගණන :-------------------
II. බස්රථයක් මිලදී ගැනීමට අදහස් කරන්නේ නම් ටෙන්ඩර් පිරිනැමු දින සිට මාස 02ක් ඇතුලත එය ඉටුකල හැකිද යන්න :------------------------

**4. ඉල්ලුම්කරන මාර්ග බලපත්‍රය**

I. ඔබ ඉල්ලුම් කරන මාර්ගය :- ----------------------------------------------
II. මාර්ග අංකය :- --------------------------------
III. එම මාර්ගය ටෙන්ඩර් යොමු අංකය :--------------------------------

**5. බලපත්‍රය සඳහා ටෙන්ඩර් මිල**

I. බලපත්‍රය සඳහා ඔබ ගෙවීමට එකග වන මුදල (අකුරෙන්) :----------------------------------
---------------------------------------------------------------------------------

II. ඉලක්කමෙන් :--------------------------------------------

**6. ආපසු ගෙවන තැන්පත්තුව වශයෙන් ගෙවා ඇති මුදල :-------------------------------------**

I. රසිට්පත්‍රයේ පිටපත් අමුණා ඇත්ද :-----------------------------------

ටෙන්ඩර් උපදෙස්, කොන්දේසි හා අනෙකුත් සියලුම විස්තර පරීක්ෂා කිරීමෙන් අනතුරුව මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන අතර, එම උපදෙස් කොන්දේසි හා සියලුම කරුණුවලට එකග වෙමි. ටෙන්ඩර් විවෘත කරන දිනට මම හෝ මගේ නියෝජිතයකු අනිවාර්යයෙන් ඉදිරිපත් වන බවද දන්වා සිටිමි.

ඉල්ලුම් කරන මගී සේවා බලපත්‍රය ලැබුනහොත් අධිකාරියේ 1996 අංක 02 දරණ ප්‍රඥප්තිය හා අනෙකුත් සියලුම නීතිරීති වලට යටත්ව බස්සේවා පැවැත්වීමට පොරොන්දු වන අතර, අධිකාරියේ පුහුණුව ලැබූ සේවක කණ්ඩායම් යොදවා අනිවාර්යයෙන්ම සේවා ඉටු කිරීමට පොරොන්දු වෙමි.

ලැබෙන වැඩිම ටෙන්ඩරය හෝ ඕනෑම ටෙන්ඩරයක් පිලිගැනීමට මගී ප්‍රවාහන අධිකාරිය බැඳි නොමැති බවද මම දනිමි.

මා විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙයින් සහතික කරමි.

දිනය :------------------------ --------------------------
අත්සන (ටෙන්ඩර්කරු)

## කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණී.

1. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර ගාස්තුව :-----------------------------------
2. ගෙවූ දිනය හා වවුචර් අංකය :------------------------------------
3. ආපසු ගෙවන තැන්පතු මුදල :------------------------------------
4. ගෙවූ දින හා වවුචර් අංකය :------------------------------------

**තැන්පතුව ආපසු ගෙවීම**

1. තැන්පත්තුව ආපසු ගෙවූ දිනය :------------------------------------
2. චෙක්පත් අංකය :------------------------------------
3. තැපෑලෙන් යැවුවේ නම් යැවූ දිනය හා ලේඛණගත කල අංකය :-------------------------
4. පැමිණ ලබා ගත්තේනම් ලබාගත් අයගේ නම හා ලිපිනය :--------------------------------------
   ---------------------------------------------------------------------------------
5. හැඳුනුම්පත් අංකය :- ---------------------------------------

දිනය :------------------ -----------------------
අත්සන (ටෙන්ඩර්කරු)

**<u>නිත්‍ය මගී ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම, ටෙන්ඩර් උපදෙස් හා කොන්දේසි.</u>**

**1.හැදින්වීම.**

1.1. දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය, නිත්‍ය මගී ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමට ධාවකයින් තෝරාගනු ලබන්නේ, ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර මගින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් මිල පදනම් කරගෙනය. ටෙන්ඩරයේ සඳහන් මාර්ගයක් සඳහා, ටෙන්ඩර් ඉල්ලුම්කරු බලපත්‍රය ලබා ගැනීමට අධිකාරියට ගෙවීමට එකග වන මුදල ඉල්ලුම්පත්‍රයේ සඳහන් කළ යුතු අතර, අනෙකුත් කරුණු සපුරා ඇත්නම් ඉදිරිපත් කරන මිළ ගණන් අනුව බලපත්‍ර නිකුත් කිරීමට සුදුසු ධාවකයින් තෝරාගනු ලැබේ.

1.2. බලපත්‍ර නිකුත් කිරීමට තෝරා ගැනීමෙන් පසු ඔහුට හෝ ඇයට නිත්‍ය මගී ප්‍රවාහන අවසර පත්‍රයක් නිකුත් කරන්නේ නම් 1996 අංක 02 දරණ දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි ප්‍රඥප්තියේ කොන්දේසි හා වරින් වර පනවා ඇති නීතිරීති, රෙගුලාසි හා නියමයන්ද ටෙන්ඩර් පත්‍රයට ඇතුලත් කර ඇති කොන්දේසි අනුවද ක්‍රියාකිරීම අවශ්‍ය වේ..

**2.ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම්**

නිත්‍ය මගී ප්‍රවාහන ව්‍යපාරයට ඉදිරිපත් වීමට කැමැති මෙම කොන්දේසි හා අධිකාරියේ නීතිරීති පිළිපැදීමට එකගවන ඕනෑම ආයෝජකයෙකුට මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.

ටෙන්ඩර් මගින් බලපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම් කරන මාර්ගය, කාලසටහනට අනුව පහසුවෙන් සේවා ආරම්භ කිරීමට හකියාව තිබිය යුතුය. සේවා ආරම්භ කිරීමට නිවසේ සිට ගමනාරම්භක ස්ථානයට අන් ධාවකයින්ට හානි වන පරිදි ධාවන කිරීම 1996 අංක 02 දරණ මගි ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තිය ප්‍රකාර බලපත්‍ර අවලංගු කිරීමට හේතුවේ.

තෝරාගනු ලබන ධාවකයින් අධිකාරියේ බලපත්‍ර කොන්දේසි හා අනෙකුත් නීතිරීති, උපදෙස් අනුව කටයුතු කිරීමට එකග විය යුතුය.

දැනට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බලපත්‍ර ලබාගෙන සිටින ධාවකයෙකු, ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර, ටෙන්ඩරය පිරිනැමීමට සුදුසුකම් ලැබුවහොත්, දැනට ඔහු පවත්වන මගී ප්‍රවාහන සේවාවේ පහත සඳහන් කරුණු සතුටුදායකව, ප්‍රමාණයත් සංඛ්‍යාවක් ඉටු කරන්නේනම් ලකුණු ප්‍රදානය කිරීමේ ක්‍රමයක් මගින් උපරිමය 50% ක් හෝ 25% හෝ 10% දක්වා වට්ටමක් ගෙවීමට කටයුතු කරනු ලැබේ. මෙම ගෙවීම කරන්නේ බලපත්‍රය ලබාගෙන මාස දොළහක ගුණාත්මක සේවා ඇගයීම මතය.

සේවක කණ්ඩායම නිළ ඇදුමක් හො ලාංජනයක් පැලඳ සේවයේ යෙදවීම.

අධිකාරිය පිළිගත් පුහුණු බලපත්‍ර සහිත සේවකයින් යෙදවීම

සමාගමක් වශයෙන් ලියාපදිංචි ධාවකයෙකු හෝ පිළිගත් සමාගමක සාමාජිකයෙකු වීම.

පාසල් සේවා/කාර්යාලසේවා/විශේෂිත සේව/ රාත්‍රි සේවා සාර්ථකව වසරකට වැඩි කාලයක් පැවැත්වීම.

ඉල්ලුම් කරන මාර්ගයේ කලින් නිකුත් කළ බලපත්‍ර තිබිම

මගී ප්‍රවාහන සේවාවක් සඳහා සහතික හෝ ත්‍යාග ලබා ඇතිනම්

බස් සේවක කණ්ඩායම සේවක අර්ථසාධක අරමුදලට දායක කර තිබිම

ඉල්ලුම් කරුට දැනට බලපත්‍ර එකට වඩා තිබිම

අධිකාරියේ නීතිරීති අනුව මාර්ග ලේඛනයකට අනුව ප්‍රවේශපත් නිකුත් කිරීම

මගින් සඳහා වූ වෙනත් ගුණාත්මක ලක්ෂණ

බස්රථයක් නොමැති ආයෝජකයෙක් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා තේරාගනු ලැබුවහොත් තෝරාගත් දිනයේ සිට බස්රථයක් මිලදී ගැනීමට උපරිම වශයෙන් මාස දෙකක කාලයක් ලබා දෙනු ඇත. අවසර දී ඇති කාලය තුල නියමිත බස්රථයක් ඉදිරිපත් කර බලපත්‍රය ලබානොගතහොත් ඔහුට හෝ ඇයට බලපත්‍රය නිකුත් කිරීමට ගනුලැබූ තීරණය අවලංගු කිරීමට අධිකාරියට බලය ඇත.

**3. ඉල්ලුම්කරුවන් සියලු කරුණු දැන සිටිය යුතු බව**

ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ලේඛන/උපදෙස්/කොන්දේසි මැනවින් පරීක්ෂා කර බලා සියලුම කරුණු සම්බන්ධයෙන් පූර්ණ දැනුමක් ලබාගත යුතුය.

අධිකාරියේ නිළධාරියෙකු හෝ වෙනත් අයෙකු කරනු ලබන වාචික පැහැදිලි කිරීම් හෝ දෙනු ලබන තොරතුරු හෝ වැරදි වටහාගැනීම් සම්බන්ධයෙන් මගී ප්‍රවාහන අධිකාරියේ බැඳීමක් නොමැත.

**4. ටෙන්ඩර් කාලසීමාව**

4.1 ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීමේ ආරම්භක දිනය :-------------------------------
(කාර්යාල වේලාව තුල පමණි.)

4.2 ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනය හා වේලාව :--------------------------------

4.3 ටෙන්ඩර් පත්‍ර විවෘත කරන දිනය හා වේලාව :--------------------------------

**5. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම**

සියලුම ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර සභාපති, දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය, අංක 01, පළමු මහල, වක්වැල්ල පාර, ගාල්ල ලිපිනයට තැපෑලෙන් එවීම හෝ ටෙන්ඩර් භාරගන්නා අවසාන දින නියමිත වේලාවට පෙර ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හෝ කළ හැකිය.

සෑම ටෙන්ඩර් ඉල්ලුම්කරුවෙක්ම තම ඉල්ලුම්පත්‍රය පිටපත් දෙකකින් යුක්තව සකස් කළ යුතු අතර, එය මුල් පිටපත හා අනු පිටපත වශයෙන් සටහන්ව තිබිය යුතුය.

දැනට අධිකාරියේ බලපත්‍ර ලබාඇති ධාවකයෙක් නම්, ටෙන්ඩරය පිරිනැමීමට සුදුසුකම් ලබා තිබේනම් හා ඔහු වට්ටම් ලබා ගැනීමට අදහස් කරන්නේ නම් ඒ සඳහා වූ ඉල්ලුම්පත්‍රයක් අධිකාරියෙන් ලබා ගෙන නිවැරදිව පුරවා ටෙන්ඩර් පිරිනැමීමේ දින සිට මාස 2 ක් අතුලත අධිකාරියට භාර දිය යුතුය.

5.3.1 ඉදිරිපත් කරන වට්ටම් අයදුම් පත්‍රයට අනුව වට්ටම් පිරිනැමීමට සලකා බලනුයේ බලපත්‍රධාරියා මෙම අධිකාරිය යටතේ ක්‍රියාත්මක කරන මගී ප්‍රවාහන සේවාවන්හි ඉදිරි වසරක ගුණාත්මක තත්වය පරීක්ෂා කිරීමෙන් පසු අධිකාරියේ නිර්නායකයන්ට අනුව සුදුසුකම් සපුරා ඇත්නම් පමණකි. වට්ටම් ප්‍රමාණය පිළිබඳ අධිකාරියේ තීරණය අවසාන තීරණය වන අතර නැවත සලකා බැලීමක් කරනු නොලැබේ.

ටෙන්ඩර් ඉදිරිපත් කරන ලිපි කවරයේ වම්පස ඉහල කෙලවර ටෙන්ඩර් යොමු අංකය සඳහන් කර තිබිය යුතුය. (ටෙන්ඩර් යොමු අංකය ටෙන්ඩර් මාර්ග පිළිබඳ විස්තර වල ඇතුලත්ව ඇත.)

ඒ ඒ මාර්ගවල බලපත්‍ර ලබා ගැනීමට ඉල්ලුම් කිරීමේදී ආපසු ගෙවන තැන්පත් මුදල අධිකාරියේ අභිමතය අනුව වෙනස්වන අතර ටෙන්ඩර් නිවේදනයේ එය සඳහන් කර ඇත. ටෙන්ඩර් පත්‍ර ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලන්නනේ නම් එම කාර්යාලයට එම තැන්පත් මුදල ගෙවා රිසිට් පතක් ලබා ගත හැකිය. රිසිට් අංකය ලිපිකවරයේ වම් පැත්තේ සඳහන් කළ යුතුය.

ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් එවනු ලබන්නේ නම් අදාල තැන්පත් මුදල තමාට ආසන්න අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලයට ගෙවා (ගාල්ල, මාතර,අම්බලන්තොට දිස්ත්‍රික් කාර්යාලවලට) එහි ඡායා පිටපතක් ඉල්ලුම්පත්‍රයේ මුල් පිටපතට අමුණා තිබිය යුතුය.

ටෙන්ඩරයේ සඳහන් කර ඇති ආපසු ගෙවනු ලබන තැන්පත් මුදල සඳහා චෙක්පත් ආදිය භාරගනු නොලැබේ. ප්‍රධාන කාර්යාලයට හෝ අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල වලට තැන්පත් මුදල් ගෙවා ඇති බව තහවුරු නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මිට පෙර මෙම අධිකාරය ටෙන්ඩර් කරන ලද මාර්ග බලපත්‍රයකට අදාලව මිල ගණන් ඉදිරිපත් කර ටෙන්ඩර් පිරිනැම්මකින් පසු ටෙන්ඩරය භාර ගැනීමට ඉදිරිපත් නොවූ ආයෝජකයෙකු විසින් මෙම ටෙන්ඩරයට අදාලවද අයදුම් පත්‍රයක් ඉදිරිපත් කරයි නම් අදාල අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට අධිකාරියට බලය ඇත.

පමාව ලැබෙන ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර පිළිගනු නොලැබේ. එවැනි ඉල්ලුම් පත්‍ර විවෘත නොකරන අතර, ටෙන්ඩර් විවෘත කල දින සිට සතියක් ඇතුලත එම ඉල්ලුම් පත්‍ර අයිතිකරුවන්ට නැවත ආපසු ලබාගත හැකිය.

**06. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර සංශෝධනය හා ඉවත් කර ගැනිම (විරෝධතා දැක්වම)**

ටෙන්ඩර් ඉලුලුම්පත්‍ර භාර ගැනීමට නියමිත අවසාන දිනයෙහි අවසාන වේලාවට පැයකට ප්‍රථමයෙන් සංශෝධන හෝ ඉවත් කර ගැනිම්, පිළිබඳ ටෙන්ඩර් භාර ගනු ලැබන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ඉදිරිපත් කල හොත් ඒ පිළිබඳ ඉඩකඩ ලබාදෙනු අත. එවැනි ඉල්ලිම් වලට වන ප්‍රමාදයන් නිසා නිසි කටයුතු සිදු නොවිම පිළිබඳව අධිකාරිය වගකියනු නොලබේ. ටෙන්ඩර් සම්බන්ධ විරෝධතා ඉදිරිපත් කිරීමට ඇතොත් ටෙන්ඩර් විවෘත කිරිමට පැයකට පෙර එවැනි විරෝධතා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත දැන්විය යුතුය. පසුව ඉදිරිපත කෙරෙන විරෝධතා පිළිගනු නොලබේ.

**07. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර පැහැදිලිව හා නිවැරදිව පිරවිය යුතු බව**

7.1 ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර පැහිදිලිව හා නිවැරදිව පිරවිම අත්‍යවශ්‍යය. ටෙන්ඩරයේ සඳහන් කරන මුදල අකුරෙන් හා ඉලක්කමෙන් නියමිත පේලියේ පැහැදිලිව සඳහන් කල යුතු අතර, කපාහැරීම හෝ මකා දැමීම් වලට කෙටි අත්සන යෙදිය යුතුය.

7.2 මාර්ග කිහිපයකට ඉල්ලුම් කරන්නේ නම් ඒ සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර හා ඇප මුදල් තැන්පත් කල යුතුය.

**08. ටෙන්ඩර් විවෘත කිරීම**

8.1 ටෙන්ඩර් විවෘත කරන දිනය හා වේලාව ටෙන්ඩර් දැන්වීමේ පත්‍රිකාවේ සඳහන් වේ. ගාල්ල ප්‍රධාන කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ ටෙන්ඩර් විවෘත කරන දිනයේ අනිවාර්යෙන්ම ටෙන්ඩර් ඉල්ලුම්කරු හෝ ඔහුගේ නියෝජිතයකු සහභිගිවිය යුතුය. නියෝජිතයකු සහභාගි වන්නේ නම් ටෙන්ඩර් ඉල්ලුම්කරුගේ ලිඛිත අනුමැතිය මත ලිපියක් ඉදිරිපත් කල යුතුය

8.2 ටෙන්ඩර් කරුවන්ගේ නම හා ඔවුන් සටහන් කර ඇති මුදල පමණක් සහභාගි වන ටෙන්ඩර්කරුවන් ඉදිරියේ ප්‍රකාශ කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කර දින සහභාගි නොවන ටෙන්ඩර් ඉල්ලුම් කරවුන්ගේ ටෙන්ඩර් පත්‍ර විවෘත නොකරන අතර විවෘත කරන ලද ටෙන්ඩර් පත්‍ර වල වැඩිම මිල අනුව ටෙන්ඩර් පිරිනැමීම කරනු ලැබේ. ටෙන්ඩර් ඉල්ලුම්කරුගේ නියෝජිත විවෘත කරන දිනට සහභාගි වන විට ඒ සඳහා අමුණා ඇති පොරමය නිවැරදිව පුරවා විවෘත කරන දිනයේ විවෘත කිරීමට නියමිත වේලාවට පැය 1/2 කට පෙර කාර්යාලයට භාර දී ය යුතුය.

8.3 විවෘත නොකරන ලද ටෙන්ඩර් ලිපි ලේඛනගත කරන අතර ටෙන්ඩර් විවෘත කල දින සිට සතියක් ඇතුලත කාර්යාලීය දිනයකදී ඉල්ලුම්කරුවන්ට ඒවා ආපසු ලබාගත හැකිය

## 09. ටෙන්ඩර් පිරිනැමීම

වැඩිම මිළ ගණන් සඳහන් ටෙන්ඩරය හෝ ඕනෑම ටෙන්ඩරයක් පිළි ගැනීමට අධිකාරිය බැඳි නැත

ටෙන්ඩර විවෘත කිරීමේ දිනයේදීම ටෙන්ඩර් පිර නැමීමට සුදුසුකම් ලැබූ ටෙන්ඩර් කරු වෙත පිරිනැමීමේ ලිපි නිකුත් කරන අතර එදිනට ටෙන්ඩර භාර ගැනීම සඳහා ටෙන්ඩරයේ ඉල්ලුම් කල මුදලින් 5% ක් අධිකාරියට ගෙවා රිසිට් පතක් ලබා ගත යුතුය එසේ මුදල් බැඳ නොමැති නම් ටෙන්ඩර් පිරිනැමීම අවලංගු වේ

ටෙන්ඩර් පිරිනැමීමෙන් පසු ටෙන්ඩර්කරු මාස 2 ක් අතුලත ඒ සඳහා බලපත්‍ර ලබාගත යුතුය මාස 2ක් ඇතුලත බලපත්‍රය නොගැනීම හෝ බලපත්‍රය ලබා ගැනීමට නොහැකි වුවහොත් ටෙන්ඩර් පිරිනැමීම අවලංගු වූ ලෙස සලකනු ලැබේ

ටෙන්ඩර් පිරිනැමීමක් භාර නොගැනීම හෝ එවැනි පිරිනැමීමක් අවලංගු වූ අවස්ථාවක ටෙන්ඩර්කරුගේ ඇප තැන්පතුව ඔහුට අහිමි වේ. ඊට අමතරව ටෙන්ඩර් කිරීම සඳහා වැය වූ මුදල හෝ ටෙන්ඩර්කරු ටෙන්ඩරය ඉල්ලුම් කල මිලෙන් 5% හෝ අය කර ගැනීමට අධිකාරියට බලය ඇත.

## 10. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර අවලංගු වීම හෝ ප්‍රතික්ෂේප කිරීම

පහත කරුණු මත ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර අවලංගු වීම හෝ ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත.

ඉල්ලුම්පත්‍රය නිසියාකාරව නොපිරවීම හා අපැහැදිලි බව

ප්‍රමාද වී ලැබීම.

ටෙන්ඩර් කරනු ලබන මාර්ගය ධාවනයට නුසුදුසු හෝ ධාවනය කිරීම පිළිබඳ වෙනත් ගැටලු පැන නැගීම.

නියමිත තැන්පත් මුදල නොගෙවීම හෝ ගෙවූ බවට තහවුරු නොවීම.

5.8 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වීම

## 11. ටෙන්ඩර් පිළිබඳ අධිකාරිය වගකීමෙන් නිදහස් වීම

මෙම ටෙන්ඩර් මගී ප්‍රවාහන බලපත්‍රයක් නිකුත් කිරීමට තොරා ගැනීම සඳහා පමණක් බැවින් ඒ අනුව අධිකාරිය විසින් බලපත්‍රයක් නිකුත් කල වහාම ටෙන්ඩරයට අදාල සියලු කොන්දේසි හා වගකීම් වලින් අධිකාරිය නිදහස් වේ

ටෙන්ඩර් මගින් බලපත්‍රයක් ලබා ගැනීම අනෙකුත් බලපත්‍රධාරීන්ට අමතරව අධිකාරයේ විශේෂ වාසි හෝ ටෙන්ඩර් කාල සටහන සංශෝධනය නොකිරීමට හෝ වෙනත් සහන ඉල්ලීමට හිමිකමක් නොලැබේ

රජයේ තීරණ, ධාවනයට ඇතිවන බාධා අධිකාරියට පාලනය කල නොහැකි හේතූන් මත ටෙන්ඩර් කරන ලද මාර්ගයකට බලපත්‍ර ලබා දීමට නොහැකි වීම මත කිසියම් මාර්ගයක ටෙන්ඩරයක් පිළිගැනීමට හෝ නොගැනීමට අධිකාරියට සිදුවිය හැකිය එවැනි අවස්තාවක ටෙන්ඩර් පිරිනොනැමීම සම්බන්ධ අධිකාරිය වගකීමෙන් නිදහස්වේ.

## 12. තැන්පත් මුදල් ආපසු ගෙවීම

ටෙන්ඩර් විවෘත කර දින සිට දින 30 ඇතුලත ටෙන්ඩර් පිරිනැමීමට සුදුකම් ලැබූ ටෙන්ඩර්කරු හා මෙම කොන්දේසි අනුව මගකීමකට යටත් නොවන  අනෙකුත් ටෙන්ඩර් අයදුම්කරුවන්ගේ මුදල ආපසු ලබාගත හැක.

තැන්පත් මුදල් ආපසු ගැනීම සඳහා තැන්පත් මුදල ගෙවූ බවට ලබාගත් රිසිට්පත්‍රය අධිකාරියට ඉදිරිපත් කල යුතුය

**ජනක් ප්‍රියන්ත ඉලේසිංහ,**
**සභාපති,**
**දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය.**